- 10 -

# අපේ මුල්කාලීන ගුවන්විදුලියේ යටත්විජිත ආකල්පය සහ ජාතික සංවර්ධන වැඩසටහන්

**මහාචාර්ය සේන නානායක්කාර**
මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

*email.senananayakkara@gmail.com*

## හැඳින්වීම සහ අරමුණ

කවරක හෝ ඉතිහාසය අර්ථවත් ලෙස විශ්ලේෂණය කොට විවරණය කිරීම වඩාත් ඵලදායී ක්‍රියාවලියකි. මන්ද යත්, එය යථාර්ථවත්ව හඳුනාගැනීම තුළින් වර්තමානය නිවැරදි කර ගැනීමත්, අනාගතය සාර්ථකව, සැලසුම්සහගතව ගොඩනගා ගැනීමත් කළ හැකි බැවිනි. අවම වශයෙන් ඒ සඳහා අදාළ පරමාර්ථසාධනයෙහි ලා පදනම සකසා ගත හැකි බැවිනි. ශ්‍රී ලාංකේය ගුවන්විදුලියේ මුල්ම දශකය මෙම සංක්ෂිප්ත නිබන්ධයට කේන්ද්‍ර කොට ගැනෙන්නේ ද එකී අපේක්ෂාව සහිතව ය. අදාළ කාලපරිච්ඡේදය තුළ එකී මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය යථාරූපීව හඳුනා ගැනෙනුයේ මෙබඳු විද්‍යාත්මක අධ්‍යයනයන් තුළිනි. සියවසකට ආසන්න වෙමින් පවත්නා ලාංකේය ගුවන්විදුලි ප්‍රචාරය අද වන විට වසර අනූ තුනක් සපුරා ඇත. ඒ අනුව, එහි ප්‍රථම දශකයක කාලපරිච්ඡේදය මෙකී අධ්‍යයනය සඳහා ප්‍රස්තුත කොට ගැනෙනුයේ එහි යටත්විජිත ආකල්ප පිළිබිඹුවත්, සංවර්ධන සන්නිවේදන ක්‍රියාවලියත් සාපේක්ෂව හඳුනාගැනීම උදෙසා ය.

## අධ්‍යයන ක්‍රමවේදය

ඓතිහාසික ගවේෂණයේදී භාවිත කළ හැකි ක්‍රමවේද රාශියක් වුව ද, තත් නිබන්ධයෙහි ලා ප්‍රස්තුත කාරණය සම්බන්ධයෙන් ගැඹුරින් අවධානය යොමු කළ හැකි වඩාත් යථාරූපී ක්‍රමවේදය වන්නේ සාහිත්‍ය විමර්ශනය යි. පොත්, පුවත්පත්, සඟරා, පර්යේෂණ වාර්තා, සැසි වාර්තා, පරිපාලන වාර්තා ඇතුළත් ලිපිලේඛන ද ඊට අදාළ විය. ඒ අනුව, මුද්‍රිත සාහිත්‍ය විමර්ශනය ප්‍රමුඛ කොටගත් අධ්‍යයන ක්‍රමවේදයක් මේ සඳහා යොදාගැනිණ.

## සාකච්ඡාව සහ ප්‍රතිඵලය

යුරෝපයේ ගුවන්විදුලි ප්‍රචාරක කටයුතු අරඹා වසර තුනක් ගතවෙන්නට මත්තෙන් එනම්, 1924 ජූනි මස 27 වෙනිදා ලාංකීය ගුවන්විදුලි ප්‍රචාරක කටයුතු ආරම්භ කෙරිණි. එය, තත්කාලීන යටත්විජිත පාලන ක්‍රියාකාරීත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස අවතක්සේරුවෙන් අර්ථකථනය කළ හැකි වුව ද, ලෝක ගුවන්විදුලි මාධ්‍ය ඉතිහාසය තුළ ලාංකීය ගුවන්විදුලි ප්‍රචාරයට හිමිවනුයේ වැදගත් තැනකි. එවකට තැපැල්පති එම්. එස්. ශ්‍රේෂ්ඨා මහතා විසින් නිකුත් කරන ලද වාර්ෂික පාලන වාර්තාව ප්‍රකාශ කරනුයේ එම වසරේ සිදුවූ සුවිශේෂතම සිදුවීම නම් මධ්‍යම විදුලි සංදේශ කාර්යාලය විසින් ලාංකීය ගුවන්විදුලි ප්‍රචාරය ආරම්භ කරනු ලැබීම බවත්, එම වසර අවසන් වන විට ගුවන්විදුලි බලපත්‍රලාභීන්ගේ සංඛ්‍යාව 53 ක් වන බවත්[(1)] ය.

ඒ අනුව, ජාතික සංවර්ධනය බඳු පුළුල් වූ ක්‍රියාකාරී සමාජ විපර්යාසයක් ලාංකීය ගුවන්විදුලියේ මුල්

කාලය හා සැසඳීම එතරම් යෝග්‍ය කාරණාවක් නොවන්නට ඉඩ ඇත. ඒ මන්ද යත්, එබඳු පුළුල් හා සංකීර්ණ සමාජ සංචලතාවක් කරා ආගන්තුක මාධ්‍යයක ඉක්මන් යොමුවීමක් හෝ ඒ සඳහා පූර්ණ දායකත්වයක් ක්ෂණික ව අපේක්ෂා කළ නොහැකි බැවිනි. නමුත්, ගුවන්විදුලිය වූ කලී සමාජ සංවර්ධන ක්‍රියාදාමයෙහි අවියෝජනීය මෙන්ම ඊට අදාළ ශක්‍යතා බහුල මාධ්‍යකාරකයක්[2] වන බැවින් ප්‍රස්තුත කාරණය හා සම්බන්ධ ඉතිහාසය ගැඹුරින් අන්වේක්ෂණය කිරීම යුක්ති යුක්ත වේ.

මෙහිදී ජාතික සංවර්ධන අරමුණු හා එකී යටත් විජිතවාදී විජාතික පිළිබිඹුව යන අර්ථකථනය හුදු භාෂාමය ප්‍රභේදයකට හෝ ජාතිකත්ව පදනමකට පමණක් සීමා නොවේ. සපුරා සමස්ත ක්‍රියාවලිය ම ඊට අයත් ය. විශේෂයෙන් ම යටත් විජිත පාලන තන්ත්‍රයක් පවත්නා රටක නම් අදාළ මව්රාජ්‍ය විසින් සකස් කරනු ලබන සැලසුම් හා න්‍යායපත්‍රයන්ට අනුව සියල්ල සිදුකෙරේ. එනම්, අධිරාජ්‍යවාදී සංකල්පයන් ද, ඊට අදාළ අරමුණු හා ප්‍රතිපත්ති ද මත පදනම් ව එහි ක්‍රියාකාරීත්වය සිදු කෙරෙන බව යි. එබැවින්, සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු බහුජාතික පදනමක වූ අප රට තුළ බ්‍රිතාන්‍යයන් විසින් ආරම්භ කරන ලද ගුවන්විදුලියේ භාවිත භාෂාව ඉංග්‍රීසිය වීම ත්, අදාළ වැඩසටහන් සැලසුම් හා ආකෘතීන් ඔවුන්ගේ ම අරමුණු හා ප්‍රතිපත්ති කෙරෙහි අනුගතවීම ත් තුළින් යථෝක්ත විජාතික යටත්විජිතවාදී පිළිබිඹුව කැපී පෙනිණි.

මුල් ම දසකය තුළ ගුවන්විදුලිය ඇසුරු කළ පිරිස සුළුතරයක් වූ හ. සිහිනයක් සැබෑ වුවක් මෙන් ම මෙකී විපර්යාසය හා බැඳෙන්නට බහුතරයකට හැකියාවක් වූයේ නැත. බහුතර ජන කොට්ඨාසයක් හා බැඳී සංවර්ධන සන්නිවේදනකාරකයක් ලෙස ක්‍රියාත්මක කළ හැකි ප්‍රබල ගුවන්විදුලි ප්‍රචාරයකට එසේ වූයේ ඇයි දැයි සොයා බැලීම මෙකී නිබන්ධයෙහි ලා ප්‍රස්තුත මාතෘකාවට බෙහෙවින් ම අදාළ වනු ඇත. යථෝක්ත යටත්විජිත පිළිබිඹුව කුළුගැන්වෙනුයේ එ තුළිනි.

ලාංකීය ගුවන්විදුලි ප්‍රචාරය ආරම්භයේ සිට 1949 ඔක්තෝබර් මස 05 වෙනිදා දක්වා ගුවන්විදුලියේ පාලකයා වූයේ තැපැල්පතිවරයා ය. විදුලි සංදේශ අංශයේ ප්‍රධාන ඉංජිනේරුවරයා ද එකී වගකීමෙහි බැඳී සිටි බවට ලාංකීය ගුවන්විදුලි ඉතිහාසය සාක්ෂි දරයි. බ්‍රිතාන්‍යය ප්‍රමුඛ ව එහි යටත් රාජ්‍යයන් හි ආරම්භ කෙරුණු ගුවන්විදුලි සේවාවන් පාලනය කෙරුණේ තැපැල්පතිවරයා යටතේ වීම විශේෂත්වය කි. එවකට ලංකා තැපැල්පති ව සිටි එම්. එස්. ශ්‍රේෂ්ඨා මහතා (Mr. Maurish Salvado Shresta – PMG, Ceylon) මෙහිදී වැදගත්වනුයේ ගුවන්විදුලි ප්‍රචාරය ආරම්භයේ පටන් පමණක් නොවේ. ඊට පෙර ද ඔහු ලාංකීය ගුවන්විදුලි ප්‍රචාරය සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කළ අයෙක් විය. 1922 දී "ලංකා වයර්ලස් සමාජය" (Ceylon Wireless Club) විජිතභාර ලේකම් වෙත ඉල්ලීම් කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳ සොයාබැලීම සඳහා පත්කරන ලද කමිටුවේ සභාපතිවරයා වූයේ ද තැපැල්පතිවරයා ය. බ්‍රිතාන්‍ය ජාතිකයකු වූ ඔහුට සහාය ලබාදුන්නෝ ද බ්‍රිතාන්‍ය ජාතිකයෝ ය. එනම්, ලංකා තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු එඩ්වර්ඩ් හාපර් මහතා (Mr. Edward Harper - The Chief Engineer of Department of Post and Telecommunication Ceylon) හා වයර්ලස් සමාජයේ සභාපති ව සිටි ලංකා අධ්‍යාපන අධ්‍යක්ෂ ලොක්ලාන් මැක්රේ මහතා ත් ය (Mr. Lauclan Mcrae, The Director of Education, Ceylon). ගුවන්විදුලි ප්‍රචාරයක් පිළිබඳ මූලික විමසුම් කාර්යයේ පටන් පර්යේෂණාත්මක අත්දැකීම් ඔස්සේ නිල ආරම්භයක් දක්වා ම ස්වකීය දායකත්වය කැප කළ බ්‍රිතාන්‍යයෝ එහි වැඩසටහන් සැලසුම හා ක්‍රියාකාරිත්වය ද ස්වකීය අභිමතය පරිදි දියත් කළ හ. ඒ අනුව පර්යේෂණාත්මක අවදියේ සිට ආරම්භය දක්වා ත්, ඉන් පසුව ත් එහි දේශීය නියෝජනයක් දක්නට නොලැබුණු තරමට ම සුළුතර විය.

එබැවින්, ලංකා සමාජාර්ථික සංවර්ධනයෙහි ලා අවම වශයෙන් ප්‍රවේශ විය හැකි හෝ දේශීය ප්‍රවණතාවක් දක්නට නොවීම ඒ පිළිබඳව ගැඹුරින් විමර්ශනය කිරීමේදී පෙනී යන කරුණ කි.

ලොක්ලාන් මැක්රේ මහතාට අමතර ව, ලංකා වයර්ලස් සමාජයේ සෙසු සාමාජිකයින් වූයේ ජේ. එස්. ඩින්විඩි, ආර්. එෆ්. ඩයස්, ජී. එච්. ජොලිෆ්, සී.ඒ. හට්සන්, එම්. එස්. රොක්වුඩ්, ඒ. ඊ. හෙලසිංගර් හා එම්.

එම්. පී. ගුණවර්ධන යන[3] මහත්වරු වෙති. මෙකී සාමාජිකත්ව පිළිබඳ කරුණු විමසීමේ දී පෙනී යනුයේ ද ඉංග්‍රීසියෙන් කථාකරන, ඉංග්‍රීසියෙන් ක්‍රියාකරන සුළුතර සමාජ කොට්ඨාසයක් මෙහි ආධිපත්‍යය දැරූ බව යි.

වැඩසටහන්වල භාෂා මාධ්‍යය හා ඒ සඳහා වූ සහභාගීත්වය ද ඊට ම අනුගත විය. නිදසුනක් ලෙස, 1927 වන විට බ්‍රිතාන්‍ය ගුවන්විදුලි සමාගමෙන් කෙටි රේඩියෝ නාට්‍ය පිටපත් ගෙන්වා ඒවා මෙක්‍රෆෝන ඉදිරියේ රඟදක්වා ප්‍රචාරය කිරීමට පටන් ගැනිණ. මෙයින් පළමුවැන්න, "වයර්ලස් ඩ්‍රාමා" (Wireless Drama) නම් විය. ජේ. එස්. එම්. පැටර්සන් මහතාගේ නායකත්වයෙන් යුත් කොළඹ ආධුනික නාට්‍ය සංගමය (Colombo Amateur Drama Club – CADC) මගින් එය නිෂ්පාදනය කෙරිණි. ඊට සහභාගි වූ ශිල්පීන් වූයේ, දොස්තර ජෝසෆ් පියර්සන්, දොස්තර ආර්. එල්. ස්පිට්ල්, දොස්තර එන්. නිකලස්, ඒ. ජේ. බ්‍රැම්ෆඩ්, සර්. රොනල්ඩ් රෝස්, කේ. ඩී. වුඩ්ස්, ඩබ්. ජේ. බෙල්, දොස්තර එෆ්. ඩී. බ්‍රයන් එලිසන් යන මහත්වරු ය.[4]

යටත්විජිතකරණයේ ආනුෂංගික සමාජ ලක්ෂණය එය යි. එනම්, ඉංග්‍රීසි උගත්, වරප්‍රසාද ලත්, ඉහළ යැයි සම්මත පුරවැසි කොට්ඨාසයන්ගේ පමණක් සහභාගිත්වය හා භාවිතය යි. ලංකාවේ පමණක් නොව, ගුවන්විදුලි ප්‍රචාරක කටයුතු ආරම්භ කළ සෙසු බ්‍රිතාන්‍ය යටත්විජිත තුළ ද විශේෂයෙන් මුල් දසකය තුළ මෙම ලක්ෂණ බෙහෙවින් කැපී පෙනිණි. අති බහුතරයක් වූ සිංහල ජාතිකයින් වෙසෙන රටක් තුළ වුව ද ප්‍රචාරය කෙරුණු වැඩසටහන්වලින් ගුවන් කාලයෙන් සියයට අනූවක් ම (90%) ඉංග්‍රීසි විය. සිංහල, දෙමළ හා හින්දුස්තානි සංගීතය ඇතුළත් පෙරදිග වැඩසටහන් සියල්ල සඳහා වෙන්කොට තිබුණේ ගුවන් කාලයෙන් සියයට දහයක් (10%) පමණ සුළු වේලාව කි.[5]

සියලු නිවේදන කටයුතු හා වැඩසටහන් ඉදිරිපත් කිරීම් ද ඉංග්‍රීසියෙන් ම සිදුකිරීම නිසා අදාළ පළමු බඳවාගැනීම් ද සිදුකෙරුණේ ඒ අනුව ය. මුලින් විදුලි සංදේශ සේවාවේ ලිපිකාර හා කාර්මික අංශවල නිලධාරීන්ම ඉංග්‍රීසියෙන් වැඩසටහන් ඉදිරිපත් කළ අතර, 1927 දෙසැම්බර් 18 වෙනිදා පූර්ණකාලීන ස්ථිර ඉංග්‍රීසි නිවේදකයකු ලෙස ආර්. ආර්. ඇන්ඩර්සන් මහතා පත් කෙරිණි. පසුව, 1934 ඔක්තෝබර් 10 වෙනිදා ඊ. වයි. ජී. රන්කින් මහතා ත්, අයි. බී. ඩී. ක්‍රෙට්සර් මහත්මිය ත් වෙන් වූයේ ද ඉංග්‍රීසි නිවේදන කටයුතු සඳහා ම ය. මුලින් තැපැල් හා ලිපිකාර සේවාවේ ඕ. වයි. පෙරේරා හා කාර්මික සේවයේ ටී. එම්. රුබේරු යන මහත්වරු ඉඳහිට තාවකාලික ව සිංහල නිවේදන කටයුතු සිදුකළ අතර එහි ප්‍රථම දසකය හමාර වන විට ත් ලාංකීය ගුවන්විදුලි සේවයට ස්ථිර සිංහල නිවේදකයෙක් නැති විය. එහි ප්‍රථමයා ලෙස ඩී. එම්. කොළඹගේ මහතා පත් කෙරෙනුයේ ද 1938 ජනවාරි මස 1 වෙනි දා ය.

එපමණක් නොව, ලාංකීය ගුවන්විදුලි සේවාව භාවිතයෙහි ලා අයිතිවාසිකම් කිව හැකි ප්‍රථම බලපත්‍රලාභියා ද ඉංග්‍රීසි ජාතිකයෙකි. 1924 අප්‍රේල් මස සිට ගුවන්විදුලි බලපත්‍ර නිකුත්කිරීම ආරම්භ කළ බවත්, එල්. ඊ. හීල් නමැති අයෙකු එවකට රෝයල් කොලීජියේ ගුවන්විදුලි සමාජය සඳහා එකී බලපත්‍රය ලබාගත් බවත් සඳහන් වේ.[6]

යටත්විජිත පාලන රටාවක් තුළ දේශීයත්වයට නැඹුරු වූ එසේ ත් නැත්නම් පෙරදිග සංස්කෘතිය හෝ දේශයේ අනාගත දියුණුව උදෙසා සෘජුව ම බලපෑම් කෙරෙන ගුවන්විදුලි ක්‍රියාකාරීත්වයක් ගැන සිතීම පවා සිහිනයක් වෙයි. එසේ සිතන්නට නම් රටේ ස්වාධීනත්වය හා ජනතාවගේ නිදහස ද තහවුරු වී තිබිය යුතු යැයි හැඟේ. එවක මෙය හිරු නොබසින අධිරාජ්‍යයේ තවත් එක්තරා කුඩා බිම්කඩක් පමණක් ම වූ බැවින් එකී ස්වභාවය ඒ සඳහා නිශ්චිත වූවා විය හැකි ය.

තොරතුරු සම්පාදනය හා විනෝදාස්වාද සම්පාදනය ද සංවර්ධන ක්‍රියාදාමයේ මූලික අංග ලක්ෂණයන් ලෙස සැලකේ. නමුත්, එවක කාලගුණ හා මාර්ග වාර්තා ඉදිරිපත්කරනු ලැබුවේ බොහෝ සෙයින් මෙහි වතුවගාවන්වල යෙදුණු විදේශිකයින්ගේ, විශේෂයෙන් ම බ්‍රිතාන්‍ය ජාතිකයින්ගේ එදිනෙදා අවශ්‍යතාවන් පදනම් කොටගෙන බව ඓතිහාසික විමර්ශනයන්හි දී පෙනී යයි. බ්‍රිතාන්‍යයින්හට අප රට තුළ හිමි ව තිබූ

මහා පරිමාණ වතු වගාවන්ට අදාළ සාධකයක් වූ කාලගුණය ත්, ඒවා පරිවහනය පිළිබඳ ගැටලුකාරී තත්ත්වයන් නිරාකරණය කෙරෙන මාර්ග වාර්තාවනුත්, වෙළෙඳපල සම්බන්ධයෙන් තොරතුරු ත් මේ වැඩසටහන් අතර ප්‍රධාන වී ඇත. පහත දැක්වෙන්නේ, වසරක් ගෙවුණු පසු එහි දෛනික වැඩසටහන් විස්තරය කි.

"The day's programme on Dec. 14, 1925 as advertised in the local press was;

| | |
|---|---|
| 11.30 a.m. | - Time signal |
| 12.00 to 12.30 p.m. | - Mail News, PWD Road Report, News Bulletin, Weather Report |
| 4.45 to 5.00 p.m. | - Market and Share Transactions, General News |
| 5.00 p.m. | - Time signal |
| 6.00 to 8.00 p.m. | - Bristol Hotel Orchestra[7] |

ඒ අතර යුධමය වාතාවරණයකට මුහුණ දෙමින් සිටි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීහු අප රට තුළ නවතාගෙන සිටි හමුදා බලඇණිවල සාමාජිකයින් සඳහා සරල විනෝදාස්වාදය ලබාදීමෙහි ලා සංගීතය ද ප්‍රචාරය කරන්නට වූහ. "Jazz Mucic", " Concert Special", "Hotel Orchestra" ආදී වශයෙන් වූ එවක ඔවුන්ට ම ආවේණික බටහිර සංගීත විශේෂාංග ඒ සඳහා භාවිත කෙරිණි. ඒ සමඟ ම ස්වකීය අධිපතිවාදී දේශපාලන ක්‍රියාකාරීත්වය ජාත්‍යන්තරය තුළ පවත්වාගැනීම ත්, ඒ සඳහා වන ප්‍රවෘත්තිමය බෙදාහැරීම ත් ඒ සමඟ ම සක්‍රීය ව සිදු කෙරිණි. සිය යටත් විජිත රාජ්‍යයන් හි පිහිටුවන්නට කටයුතු කළ "Empire Service" හෙවත් ණිඅධිරාජ්‍ය සේවාවෑ ලංකාවේ පිහිටුවීම ද මෙහි කේන්ද්‍රීය සිදුවීම කි. 1934 පමණ වන විට ඊට අදාළ සුවිශේෂ ග්‍රාහක මධ්‍යස්ථාන (Receiving Centres) පිහිටුවා ලූ බවත්, කොළඹ එවකට බුලර්ස් පාරේ ප්‍රසිද්ධ ගොල්ෆ් පිටියෙහි ඉන් එක් යන්ත්‍රයක් සවිකළ බව ත් කියැ වේ.[8]

මේ කරුණු තුළින් අනාවරණය කෙරෙනුයේ කුමක් ද? අද වන විට අප අපේක්ෂිත සමාජාර්ථික සංවර්ධනය උදෙසා එවක මුල්කාලීන ගුවන්විදුලියේ නැඹුරුවක් හඳුනාගත නොහැකි බව යි. අධිරාජ්‍යවාදීන්ගේ ම පරිපාලන පහසුව ත්, ස්වකීය බලපරාක්‍රමය තවදුරට ත් තහවුරු කරගනිමින් සලසා ගන්නා මව් රාජ්‍යයේ ආර්ථික යහපත ත් මෙහි අරමුණු වූ බව පෙනේ. ලංකාවේ ගුවන්විදුලි කටයුතු ආරම්භ කළ යුතු ද? ඒ කෙසේ ද? යන්න විමර්ශනය කිරීම සඳහා 1923 දී පත්කළ කමිටුව, එය රාජ්‍ය පාලනයට යටත් කළ යුතු බව නිර්දේශ කළේ[9] ද එබැවින් ම විය හැකි ය. පසුකාලීන ගුවන්විදුලි ප්‍රචාරයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් විමර්ශනය කිරීමේදී එය මනා ව ඔප්පු කෙරේ.

බලය, දැනුම, ප්‍රාග්ධනය හා තාක්‍ෂණය ද බ්‍රිතාන්‍යයෙන් ම පොම්ප කරද්දී ත්, විදුලි සංදේශ ඉන්ජිනේරුවරුන් ප්‍රමුඛ කාර්මික ශිල්පීන් හා සියලු පරිපාලකයින් ගුවන්විදුලි පුහුණුව සඳහා ශිෂ්‍යත්ව මඟින් බ්‍රිතාන්‍යයට ම පටවද්දී ත්, එකල සිදුවූවාට වැඩි යමක් අපේක්‍ෂා කළ නොහැකි ය. අධික ස්වාමි භක්තිය බොහෝ විට වැරදි සම්ප්‍රදායයන් ගොඩනැගීමෙහි ලා පහසුකම් සපයන බැවිනි.

1932 නොවැම්බර් මස 21 වන දින ටොරින්ටන් චතුරස්‍රයේ ගුවන්විදුලි මධ්‍යස්ථානයේ දී ප්‍රථම වරට රැස්වූ ගුවන්විදුලි උපදේශක සභාව ගනිමු.[10] එහි ප්‍රධානත්වයෙහි වූයේ එවකට තැපැල් හා විදුලි සංදේශ ප්‍රධාන ඉන්ජිනේරු ජේ. ෂිල්ටෝ (Mr. Jhon Shilitoe) මහතා ය.

| | |
|---|---|
| ජේ. එස්. ඩින්විඩි | ගුවන්විදුලි නියෝජිත |
| ජේ. එෆ්. නෙස් | ලංකා හා දකුණු ඉන්දීය ගුවන්විදුලි සමාජය |
| එස්. එන්. ගොඩ්ප්‍රි | අධ්‍යාපන උප අධ්‍යක්‍ෂ |
| ජේ. එස්. එම්. පැටර්සන් | කොළඹ ආධුනික නාට්‍ය සංගමය |
| චාර්ල්ස් ඩයස් | සිංහල අසන්නන් නියෝජනය |
| මුදලිඳු ඩී. රාසනායගම් | දෙමළ අසන්නන් නියෝජනය |

| | |
|---|---|
| එච්. එච්. එම්. ගසාල් | මුස්ලිම් අසන්නන් නියෝජනය |
| ඊ. ඩී. විලියර්ස් | රජයේ වැඩ හා විදුලිසංදේශ විධායක නියෝජනය |
| එච්.එල්. ඩී. මෙල් | රජයේ වැඩ හා විදුලිසංදේශ විධායක නියෝජනය |
| ඩී. ලස්ක් | ප්‍රාදේශීය ඉන්ජිනේරු |
| ආර්. ආර්. ඇන්ඩර්සන් | ලේකම් |

යන අය එහි සෙසු සාමාජිකයෝ වූහ. මෙහි විශේෂත්වය නම්, සිංහල, දෙමළ හා මුස්ලිම් නියෝජිතයින් තිදෙනා හැරුණු කොට සෙස්සන් අතර බහුතරය ඉංග්‍රීසි ජාතිකයින් වීම යි. 1948 වර්ෂයේ මැද භාගය දක්වා ක්‍රියාත්මක වූයේ මෙකී උපදේශක සභාව යි. අපට උරුම දේශීය සම්ප්‍රදායයක් හෝ ජාතික අනන්‍යතාවක් සඳහා මෙහි පිටුබලය කෙබඳු වන්නට ඇත් ද?

සංවර්ධනය යනු අදාළ සමාජාභ්‍යන්තරයෙන් පැන නැගෙන අවශ්‍යතා කෙරෙහි ගෝචර විසඳුම් ක්‍රියාමාර්ග සහිත ක්‍රියාවලිය කි. එය, එකී සමාජයේ අතිබහුතර සාමාජික ජීවන තත්ත්වයන් කෙරෙහි සමීප විය යුතු ය. ඔවුන්ගේ භාෂාව, සංස්කෘතිය හා ඔවුන්ගේ ජීවිත සමග බැඳී ඇති සකලවිධ වටපිටාව ද ඊට අදාළ විය යුතු ය. නමුත්, මෙහිදී සිදුවූයේ අනෙක කි. යටත්විජිත ගුවන්විදුලි සේවා පිළිබඳ පත්කළ විමර්ශන කමිටුවේ ප්ලීමත් වාර්තාව හෙළි කළ පරිදි "එම රටවල වෙසෙන විදේශිකයින්ට විනෝදාස්වාදය ලබාදීම සඳහා පමණක් නොව, යටත්විජිත පාලනය පහසුවෙන් කරගෙන යාමට උදව්වන පාලන උපකරණයක් වශයෙන් ද[11] ඔවුනට එය වැදගත් විය. එබැවින්, තනතුරු නාමවලින් පටන්ගෙන, එහි අභ්‍යන්තර සැලසුම්, ආකෘතීන්, සංවිධාන ව්‍යුහයන්, අන්තර්ගතයන් හා ඉදිරිපත්කිරීම් මෙන්ම සෙසු සියලු භාවිතයන් ද අධිරාජ්‍යවාදී යටත්විජිත රාමුව තුළ සිරකොට තැබිණි. ඒ අනුව, එවක ලාංකීය ගුවන්විදුලිය කොන්දේසි විරහිතව ම බ්‍රිතාන්‍ය ගුවන්විදුලි සමාගමේ ම යටත්විජිත ශාඛාවක් ලෙස ම ක්‍රියාත්මක වී ඇති බව පෙනේ.

BBC ගුවන්විදුලි ආයතනය පිළිබඳ ලෝක ජනතාව අතර ගොඩනැඟුණු ප්‍රසාදජනක හැඟීම අන් කවරක් හෝ නිසා නොව, එහි මධ්‍යස්ථභාවය හෙයිනි. රජයේ දැඩි බන්ධනයෙන් නිදහස් ව හුදෙක් මහජනසේවා ජනමාධ්‍ය මෙහෙවරක් ඉටුකරන්නට එවක BBCයට හැකියාව තිබිණි. 17, 18, 19 වන සියවස්වල සිට සමාජ බලවේගයක් ලෙස අපරදිග ලෝකය තුළ ව්‍යාප්ත වී තහවුරු කෙරුණු ඓතිහාසික පුවත්පත් නිදහස පිළිබඳ සාංකල්පික මතවාදය ඊට පිටුබල සැපයී ය. නමුත්, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ස්වකීය යටත්විජිත රාජ්‍යයන්හි පිහිටුවාගත් ගුවන්විදුලි මධ්‍යස්ථාන සම්බන්ධයෙන් එකී මතවාදී ස්ථාවරත්වය වලංගු නොකළ බව අවධාරණය කළ යුතු ය. ශ්‍රී ලංකාවට අමතර ව, ඉන්දියාව, නයිජීරියාව, ඝානාව හා තවත් රටවල් කිහිපයක මෙන් ම, කැරිබියන් දූපත් විසිගණනකට ආසන්න ව පිහිටුවා ගත් ගුවන්විදුලි සේවාවන් මේ සම්බන්ධයෙහි ලා තහවුරු කෙරිණි. ඉන් පිටවූ නිවේදනයන්හී අන්තර්ගත වූයේ ඔවුන්ගේ අධිපතිවාදය යි. ඉන් ගලාගිය සංගීතයෙහි රිද්මය වූයේ අධිරාජ්‍යවාදී ආස්වාදය යි.

1935 මැයි මස 06 වෙනිදාට යෙදී තිබුණු බ්‍රිතාන්‍යයේ පස්වන ජෝර්ජ් මහරජාණන්ගේ රිදී ජුබිලිය සැමරීම ලංකා ගුවන්විදුලියේ දෙදිනක් පුරා නොමසුරුව සිදුවූයේ එබැවිනි. ලංකා ගුවන්විදුලි ප්‍රචාරය මුළුමනින් ම කපා හැර එංගලන්තයේ සිට විසුරුවා හැරි වැඩසටහන් 178 ක් අඛණ්ඩ ව ප්‍රචාරය කෙරිණි.[12] අප එරී සිටි යටත්විජිත ගොහොරුවේ ගැඹුර කොපමණ ද?

එය එසේ වුව ද, මේ පුංචි කොදෙව්ව අති උතුම් ජෝර්ජ් මහරජාණන් වහන්සේගේ අණසක යටතේ පැවති බැවින්, යට කී පරස්පරයන් සම්බන්ධයෙන් ලාංකිකයන් තුළ ගැටලු පැන නොනැගෙන්නට ඇත. වෙසෙසින් ම, ලංකාවේ වුව ද එකී බලධාරීත්වයේ ඔටුනු හෙබැවූයේ සුද්දන් ම වූ බැවිනි.

කෙසේ වුව ද ලාංකීය ගුවන්විදුලි ප්‍රචාරය ආරම්භ වී වසර දහයක් ගත වූ තැනත් එනම්, 1934 අවසානය වන විටත් ලියාපදිංචි ව තිබූ බලපත් ප්‍රමාණය 2342 ක් පමණි. මෙකී මන්දගාමී තත්ත්වයට

තවත් හේතු කාරණා විමසිය යුතු ද? නැත. ඒ පිළිබඳ වඩා ත් සාධාරණ කරුණු ඉදිරිපත්කරන වැදගත් ලිපියක(13) කොටස් කිහිපයක් මෙහි ලා උපුටා දැක්වීම සුදුසු යැයි හැඟේ. මෙය එවකට තැපල්පති ව සිටි ජේ. ආර්. වොල්ටර්ස් මහතා විසින් ගුවන්විදුලි ප්‍රචාරය බාරව ක්‍රියාකළ මංමාවත් හා කර්මාන්ත ඇමති ජේ. එල්. කොතලාවල මහතා වෙත 1936 අප්‍රේල් මස 06 වෙනි දින යවන ලද්ද කි. එහි මෙසේ සඳහන් වෙයි.

"බොහෝ පෙරදිග රටවල් බ්‍රිතාන්‍ය ගුවන්විදුලි ප්‍රචාරක ස්ථානයෙන් විසුරුවා හරින වැඩසටහන්වලට කැමැත්තක් නො දක්වති. ඔවුන් කැමති තම බසින් ප්‍රචාරය වන වැඩසටහන්වලට ය."

"දැනට වැඩසටහන් පිළියෙල කරනු ලබන්නේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරුවරයා හා ඔහුගේ කාර්යමණ්ඩලය මඟිනි. අන් කිසි රටක එබන්දක් සිදු නොවේ. වැඩසටහන් පිළියෙල කිරීමෙහි ලා ඉන්ජිනේරුවන් විශේෂඥයින් නොවන බැවිනි."

බ්‍රිතාන්‍ය ජාතිකයෙකු වුව ද, මෙකල නොකියැවෙන ඇත්ත ඔහු ප්‍රකාශ කොට ඇත. ඒ අතර, ප්‍රකට විද්‍යාර්ථීන් දෙදෙනෙකු වන එලිහු කැට්ස් හා ජෝර්ජ් වෙඩෙල් ගේ විමර්ශන වාර්තාවක කොටසක් උපුටා දක්වමින් මෙම නිබන්ධය නිමා කරමි. "ගුණාත්මකභාවය මෙන්ම වෘත්තීය නිදහස සම්බන්ධ කෝදුව ලෙස බොහෝ සංවර්ධනය වන රටවල ගණන් ගන්නේ බී.බී.සී. ආකෘතිය යි. එම රටවල එතරම් ම ප්‍රයෝජනවත් නූනත් බී.බී.සී. ආයතනයේ වැඩසටහන්වල ගුණාත්මකභාවය හා ක්‍රියාකාරකම් ද සංවර්ධනය වෙමින් පවත්නා රටවවල ප්‍රතිමාන සේ සලකා ඇත. මෙ මඟින් ඇති වූ අහිතකර ප්‍රතිඵලය නම්, සංවර්ධනය වන රටවලට උචිත එම රටවලට ආවේණික, සමාජ ආර්ථික හා දේශපාලනික වාතාවරණයට ඔබින ලෙස ප්‍රතිමානයන් සාදාගැනීම සිදු නොවීම යි. මේ හේතු නිසා ජාතිය ගොඩගැනීමේ ක්‍රියාවලියේ දී ඊට ඔබින විද්‍යාත්මක හා බුද්ධිමය එළැඹුමක් අනුව සුදුසු ආකාරයකින් ප්‍රතිමානයන් තනා ගැනීම මඟහැරී ඇත."(14)

### නිගමනය

ලාංකීය ගුවන්විදුලි මාධ්‍යයෙහි පුරෝගාමී පාර්ශවය බ්‍රිතාන්‍යයෝ වෙති. එබැවින් එහි ආකෘතිය, වැඩසටහන් සැලසුම්, ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාකාරී අරමුණු සහ ඉදිරිපත්කිරීම් ද ඔවුන්ට ම ආවේණික විය. යටත්විජිතවල ස්වකීය පරිපාලනය පහසුකර ගැනීමත්, බල පරාක්‍රමය පතුරුවා හැරීමත් එහි ප්‍රමුඛ අධ්‍යාශය විය. කරුණු මෙසේ හෙයින්, ලාංකීය ගුවන්විදුලි ප්‍රචාරයෙහි ප්‍රථම දශකය තුළ එකී සේවාවෙන් ජාතික සංවර්ධනයෙහි ලා ඉටුකෙරුණු සන්නිවේදන මෙහෙවර ඉතා අල්ප බව ත්, සියල්ල අභිභවා එහි විජාතික යටත්විජිත ආකල්පමය ස්වරූපය කැපී පෙනුණු බවත් නිගමනය කෙරේ.

### - පරිශීලිත මූලාශ්‍ර -


1) කොළඹගේ, ඩී. එම්. (1978), ගුවන්විදුලි වංශය, 10 පිටුව. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, කොළඹ.

2) මහේන්ද්‍ර සුනන්ද (1975), ශබ්දමාධ්‍යය හා ශ්‍රී ලංකාවේ ගුවන්විදුලිය, 24 පිටුව දීපානි මුද්‍රණ ශිල්පියෝ, ඩී. එම්. කොළඹගේ, ඩී. එම්. (1972), ගුවන්විදුලියයි මමයි, 12 පිටුව, කොළඹ.

3) කොළඹගේ, ඩී. එම්. (1972), ගුවන්විදුලියයි මමයි, 59-61 පිටු

4) Gunawardhane, C.L.P. (1990), This is Colombo Calling; Official Inauguration of Broadcasting in Ceylon, p.17, Perali Publishers, Colombo ("The Outstanding events in telephony was the inauguration of Broadcasting from the CTO and by the end of 1924 the total number of licensees were 53")

5) Aspinall, R. (1971), A Manual for Training ; Radio Programme Production, p.19, Place De Fontenoy, Pairs, 1971. (They help to broaden our enjoyment of life and further our knowledge and

understanding of things about us, and by bringing us information they help to stimulate individual and group action. In developing countries they have a significant role to play in speeding the Process of Social Changes.)

6) Gunawardhane, C.L.P. (1990), This is Colombo Calling, p.4

7) කොළඹගේ, ඩී එම් (1978), ගුවන්විදුලි වංශය, 10 පිටුව් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, කොළඹ,

8) Mudlyr Abayasekara, E.A – Thirty Seven Years of Broadcasting in Ceylon (Article) Ceylon Radio Times; Dec.31, 1962 - Jan:13,1963 .pp. 34-35 ( "Ten percent of the broadcast hours was allocated to oriental items consisting of Sinhala, Tamil and Indian music" )

9) Gunawardane, C.L.P. (1990), p.18 ( The issue of licences started in April, 1924. Mr. L.E. Heel was the first licence had been obtained by Royal College, Colombo." )

10) Gunawardane, C.L.P. (1990), p.20

11) Mudlyr Abeyasekara, E.A. Ceylon Radio Times: (Article) ("The Government did not wishbroadcasting to function as a private company and placed the broadcasting service under the Post and Telecommunication Department ." )

12) Gunawardane, C.L.P. (1990), p.xxiv

13) Plymouth Committee Report (1937), pp 5-6 Interim Report of a Committee on broadcasting services in the colonies, Colonial No. 139 HMOS, London, අනුව,

කරුණානායක, නන්දන (1990), හැටහය වසරක ගුවන්විදුලිය, ප්‍රථම මුද්‍රණය, 21 පිටුව. ජන කේන්ද්‍රය, කටුබැද්ද, මොරටුව.

14) Elihu Katz and Jeorge Wedell (1977), Broadcasting and National Development, Harvard University Press, ට අනුව,

කරුණානායක, නන්දන - හැටහය වසරක ගුවන්විදුලිය (1990), 24-25 පිටු